// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 12,273 — 1961 ජනවාරි 23 වැනි සඳුද — 23.1.1961**

**(ආණ්ඩුවේ බලයෙන් පිට ප්‍රසිද්ධ කරනු ලැබේ)**

# I වැනි කොටස: (I) වැනි ජේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### නිවේදනය

1946 හා 1947 ලංකා (ආණ්ඩු ක්‍රම හා ස්වාධීනතා) රාජ්‍ය සභා නියෝගවල 46 (4) අංකිත ජේදයේ විධිවිධාන යටතේ සිරිමා ආර්. ඩයස් බණ්ඩාරනායක නැමැති මා අගමැතිණිය වශයෙන් '' ජාතික ක්‍රම සම්පාදනය '' නැමැති විෂය, 1961 ජනවාරි 24 වැනි දින සිට මා යටතේ තබාගැනීමට තීරණය කර ඇති බවත්, ඒ අනුව :—

(අ) '' අගමැති හා ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති '' යන ශීර්ෂය යටතේ '' දෙපාර්තමේන්තු '' වලට අදල වන තීරයේ සඳහන් '' ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව '' යන වචනවලට පසුව '' ජාතික ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුව '' යන වචන ඇතුළත් කිරීමෙන්ද, විෂයයන්ට හා කාර්‍යයන්ට අදල වන තීරයේ සඳහන් '' අනුරාධපුර ශුද්ධ නගර සංරක්ෂණය හා නව නගරය සංවර්ධනය කිරීම '' යන වචනවලට පසුව '' ක්‍රම සම්පාදක ලේකම් කාර්‍යාලය '' යන වචන ඇතුළත් කිරීමෙන් ද,

(ආ) '' මුදල් ඇමති '' යන ශීර්ෂය යටතේ '' දෙපාර්තමේන්තු '' වලට අදලවන තීරයේ සඳහන් '' ජාතික ක්‍රම සම්පාදක දෙපාර්තමේන්තුව '' යන වචන කපා හැරීමෙන්ද, විෂයයන්ට හා කාර්‍යයන්ට අදලවන තීරයේ සඳහන් '' ක්‍රම සම්පාදක ලේකම් කාර්‍යාලය '' යන වචන කපා හැරීමෙන්ද,

1960 ජුලි 23 වැනි දින හා අංක 12,165 දරණ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පළකරන ලදින්, 1960 දෙසැම්බර් 9 වැනි දින හා අංක 12,245 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නිවේදනයෙන් සංශොධිත නිවේදනය සංශෝධනය කරනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

අගමැති කාර්‍යාලය,
කොළඹ, 1961 ජනවාරි 23.
1—893.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අගමැතිණිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

47--ජේ. ඇන්. ආර් 15278—4,075 (1/61)